රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 345

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1986 ඔක්තෝබර් මස 03 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු
## ආයතන සංග්‍රහයේ - XII වැනි පරිච්ඡේදය

23:2 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කළ මැනවි.

"23:2 - ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු සඳහා දිවයිනෙන් බැහැර නිවාඩු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ද මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරියකු සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ද නිවාඩු අනුමත කරනු ඇත. එවැනි නිවාඩු සඳහා වන අයදුම් පත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් හා අදාල අමාත්‍යාංශ ලේකම් මගින් ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යාංශයක් යටතේ වර්ග නොකරන ලද දෙපාර්තමේන්තුවක් සඳහා එම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය".

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.